# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2074/2 - 2018 ජුනි මස 04 වැනි සඳුදා - 2018.06.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*යොමු අංකය*: MTR/LND/ACQUI/LI/3950
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* :ඉඅ4-3/2/2014HA/114.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශ්‍යයතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්, 1994 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 417 ඒ කඩවීදිය නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ කඩවීදිය ගමේ පිහිටි මු.පි. මාර/2730 පිඹුරේ කැබලි අංක 01, 02, 03 වශයෙන් දැක්වෙන මතු සඳහන් ඉඩම් මාතර ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය ඉදිකිරීම සඳහා අත්කරගනු ලැබේ.

**උපලේඛනය**

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: කොට්ටම්බගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර දෙමහල් ගොඩනැගිල්ලක්, ස්ථිර ගොඩනැගිලි දෙකක්, ජල ටැංකියක් සහ වැසිකිළි දෙකක් ඇත; ඉඩමේ හිමිකම් කියන්නා: එච්. එම්. එන්. ජයරත්න, අංක 59, කුමාරදාස මාවත, මාතර; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0838.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: මෙස්ත්‍රිගේවත්ත *නොහොත්* කන්දුකොට්ටම්; ඉඩමේ විස්තරය: විවෘත මුඩුබිම; ඉඩමේ හිමිකම් කියන්නා: එච්. එම්. එන්. ජයරත්න, අංක 59, කුමාරදාස මාවත, මාතර; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0040.

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: මෙස්ත්‍රිගේවත්ත *නොහොත්* කන්දුකොට්ටම්; ඉඩමේ විස්තරය: සිමෙන්ති කාණුව; ඉඩමේ හිමිකම් කියන්නා: මුල් හිමිකම් පාන්නකු සොයාගත නොහැක; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.0007.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යයතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2018 ජුනි මස 25 වැනි දින පෙ.ව. 10.30ට මාතර කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය. තවද 2018 ජුනි මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඩී. ඩී. කේ. වික්‍රමආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
මාතර කඩවත්සතර.

2018 මැයි මස 31 වැනිදා,
මාතර කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 753

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A – G 27800 - 17 (2018/06)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.